සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය -2020
-------------------------------------------------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2018 ජූලි 25 දින එළඹි අංක 6228 LK දරන ණය ගිවිසුමේ 5.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය
---------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ හාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ හාරකාරත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණික සහාය යන සංරචක දෙකක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ.
ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 449,645 කට සමාන වූ එජඩො මිලියන 2,900 වන අතර ඉන් රු. මිලියන 15,505 කට සමාන වූ එජඩො මිලියන 100 ක් මූල්‍යයනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 434,140ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපෙරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2018 අගෝස්තු 30 දින ආරම්භ කරන ලද අතර, 2024 ජූනි 30 දින වනවිට නිම කිරීමට සැලසුම් කර ඇත.

1.3 මතය
-------

2020 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම
------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1** **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018/04/05 දිනැති ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 52 වන කොටස. | 2021 ජූලි 9 දින වන විටත් තෙවන පාර්ශවීය වලංගු කිරීමේ ආයතනයක් පත් නොකිරීම හේතුවෙන්, 2020 වර්ෂය සඳහා වූ දර්ශක අත්පත් කර ගැනීම පිළිබඳ ස්වාධීන තක්සේරු වාර්තාව ලෝක බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. | COVID-19 වසංගත තත්වය සමඟ පාසල් වසා දැමීම හේතුවෙන් 2020 සඳහා තෙවන පාර්ශවීය වලංගුකරණ වාර්තාව (TPV) සකස් කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතු බව |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020 මැයි 29 දිනැති අංක HD/21/05/05-01 දරණ ලිපිය | සංරචක I සහ II යටතේ Covid 19 වසංගත තත්වය පැතිරීම වැළැක්වීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු වෙත රුපියල් මිලියන 617.36 ක් මුදා හැර තිබූ අතර, භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා අදාළ දෙපාර්තමේන්තු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් අදාළ කටයුතු සඳහා යොදාගත් මුදල කොපමණද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | එම වාර්තා ඉදිරිපත් කරන ලෙස සියලුම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට උපදෙස් දී තිබුණද, පවතින තත්ත්වය මත බලාපොරොත්තු වූ පරිදි එම වාර්තා ඉදිරිපත් කර නොමැත. | අමාත්‍යාංශ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතු බව. |
| (ඇ) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 07 වැනි කොටස, 2016 ජූනි 10 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි අංක 133 | අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනය සිදුකිරීමේ ප්‍රමාදයක් ඇත්නම් අදාළ ශාඛාව සමඟ සාකච්ඡා කර එය නිවැරදි කරගත හැකිය. | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම කළ යුතු බව. |
| (ඈ) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 5.1 කොටස | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වනතුරු පළාත්වලට ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාද වීම හේතුවෙන් මෙහෙයුම් කමිටුව කැඳවීමට නොහැකි වීම. | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතට අනුකූලව ක්‍රියා කළ යුතු බව |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු | කළමනාකාරිත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය | | | | |
| | | ප්‍රතිශතය | ප්‍රතිශතය | | | | |
| සංරචක 1 (අ) | ප්‍රසම්පාදන සැලැස්ම | 21 | 9 | ප්‍රසම්පාදන සැලැස්මට අනුව ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ 21 ක් ප්‍රසම්පාදනය සඳහා රුපියල් මිලියන 105 ක් වෙන් කර තිබුණි. නමුත් ඉන් ප්‍රසම්පාදන 9 ක් පමණක් ක්‍රියාත්මක කර විවිධ හේතූන් මත ප්‍රසම්පාදන 7 ක් අවලංගු කර තිබුණි. ඉතිරි ශේෂය අමාත්‍යාංශයේ වෙනත් ශාඛා වෙත මාරු කර ඇති බව විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. ඒ අනුව එහි ප්‍රගතිය සියයට 42.8 කි. | ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් සමහරක් Covid 19 වැළැක්වීමේ වැඩසටහන් සඳහා මාරු කර තිබුණි. | COVID-19 පැතිරීම වළක්වා ගනිමින් පාසල් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් සනීපාරක්ෂාව සහ පාසල් සෞඛ්‍ය වැඩසටහන් වෙනුවෙන් පහසුකම් සැලසිය යුතුය. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් සමහරක් මෙම වැඩසටහන් වෙත මාරු කිරීමට සිදුවිය. | ප්‍රසම්පාදන සැලැස්මේ දක්වා ඇති කාල සීමාව තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් කළ යුතු බව |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| සංරචක I (ආ) | විෂයමාලා සංවර්ධනය | 20 | 05 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, විෂයමාලා සංවර්ධන නිලධාරීන් සහ අනෙකුත් මානව සම්පත් සංවර්ධන නිලධාරීන් සඳහා ශාස්ත්‍රපති උපාධි 20 ක් පිරිනැමීමට රුපියල් මිලියන 242 ක් වෙන් කර තිබුණි. එයින් රුපියල් මිලියන 14.34 ක් එනම් සියයට 6 කට සමාන මුදලක් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් පස් දෙනෙකුට ශාස්ත්‍රපති උපාධි පාඨමාලා පැවැත්වීම සඳහා වැය කර තිබුණි. | Covid - 19 වසංගත තත්වය හේතුවෙන් ලොව පුරා බොහෝ රටවල් වසා දමා තිබුණි. | මේ වසරේ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අපේක්ෂකයින් 20 දෙනෙකු විදේශ විශ්වවිද්‍යාලවලට යැවීම සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ලොව පුරා පැතිර යන COVID-19 වසංගත තත්වය හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි විය. එසේ වුවද නිලධාරීන් පස් දෙනෙකු අන්තර්ජාලය ඔස්සේ විදේශ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ආරම්භ කළහ. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ සැලසුම් කළ ක්‍රියාකාරකම් වලට ප්‍රතිපාදන යොදා ගත යුතු බව. |
| සංරචක I (ඇ) | මූලධර්ම නිපුණතා රාමුව | රුපියල් මිලියන 40.4 | රුපියල් මිලියන 1.53 | මූලධර්ම නිපුණතා රාමුව සඳහා රුපියල් මිලියන 40.4 ක් වෙන් කර තිබූ නමුත්, ඒ සඳහා වැය කර තිබුණේ රුපියල් මිලියන 1.53 ක් පමණි. | Covid - 19 වසංගත තත්වය හේතුවෙන් මූලික මූලධර්ම පුහුණු පාඨමාලා පැවැත්වීමට නොහැකි වී තිබුණි. | COVID-19 වසංගත තත්වය හේතුවෙන් මූලික මූලධර්ම පුහුණු පාඨමාලා පවත්වනු ලැබුවේ නැත. දෙමළ මාධ්‍ය පැවරුම් 480 ක ඇගයීම්, පුහුණු කිරීම් සහ පළාත් සම්පත් දායකයින් ඇගයීම අවසන් කරන ලදී. මේ සඳහා වැය වූ මුදල රු. 1,528,230 කි. | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් වලට ප්‍රතිපාදන භාවිතා කළ යුතු බව |
| සංරචක I (ඈ) | ධාරිතා සංවර්ධන වැඩසටහන | රු. මිලියන 10 | රුපියල් මිලියන 1.24 | ධාරිතා සංවර්ධන වැඩසටහන සඳහා රුපියල් මිලියන 10 ක් වෙන් කර තිබුණි. එයින් ඉලක්කගත වැඩ සඳහා වැය | Covid - 19 වසංගත තත්වය හේතුවෙන් සැලසුම් කරන ලද කාර්යයන් ක්‍රියාත්මක | SLEAS සහ SLTES නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් තුනක් පවත්වන ලදී. එම වැඩසටහන් සඳහා | අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම් කළ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | කර තිබුණේ රුපියල් මිලියන 1.24ක් පමණි. | කිරීමට නොහැකි විය. | වැය වූ මුදල රු. 1,242,035 කි. COVID-19 වසංගත තත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා සැලසුම් කර තිබූ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. | ක්‍රියාකාරකම් වලට ප්‍රතිපාදන භාවිතා කළ යුතු බව |
| සංරචක I (ඉ) | උෂ්ණත්වමාන මිලදී ගැනීම | රුපියල් මිලියන 148.9 | රුපියල් මිලියන 3.1 | සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව විසින් රුපියල් මිලියන 148.9 ක ප්‍රතිපාදන යොදාගෙන පාසල් 10,175 ක් සඳහා උෂ්ණත්වමාන මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සිසුන්ගේ ශරීර උෂ්ණත්වය මැනීම අවශ්‍ය නොවන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කමිටුවේ ප්‍රධානියා දන්වා තිබුණි. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ වලට පටහැනිව අධ්‍යාපන අමාත්‍යාංශය මේ සඳහා රුපියල් මිලියන 3.1ක් වියදම් කර තිබුණි. | ශරීර උෂ්ණත්වය මැනීම අනවශ්‍ය බව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. | COVID-19 වසංගත තත්වය වැළැක්වීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයට අනුව, අදාළ ආයතනවලට ඇතුළු වීමට පෙර පුද්ගලයින්ගේ ශරීර උෂ්ණත්වය මැන බලන ලෙස උපදෙස් දෙනු ලැබේ. | සෞඛ්‍ය අමාත්‍යාංශය උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතු බව |
| සංරචක I (ඊ) | මුහුණු ආවරණ මිලදී ගැනීම සහ ලබා දීම | රුපියල් මිලියන 335 | රුපියල් මිලියන 71.2 | සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව විසින් රුපියල් මිලියන 335ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන දිවයින පුරා පාසල් 10,175ක් සඳහා මුහුණු ආවරණ මිලදී ගෙන ලබාදීමට සැලසුම් කර තිබුණද ඒ සඳහා වැය කර | සැලසුම් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ අඩුපාඩු | සියලුම පාසල් සඳහා පාසල් පාදක ප්‍රදාන ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ප්‍රතිපාදන ලැබී ඇත. මෙම තත්ත්වය තුළ, පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව විසින් ලේකම්වරයාගේ අනුමැතිය | අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු බව |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | තිබුණේ රුපියල් මිලියන **71.2**ක් පමණි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට **21**ක් වුවද, භෞතික ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | ඇතිව සියලුම රජයේ පාසල් සඳහා සම්පූර්ණ ප්‍රදාන ලබා දුන්නේය. | |
| සංරචක **II** (අ) | විෂයමාලා සංවර්ධනය | රුපියල් මිලියන **10** | විගණනය සඳහා ඉදිරිපත් කර නැත | ජාතික අධ්‍යාපන ආයතනයට රුපියල් මිලියන **10**ක මුදලක් ලබාදී තිබුණද, ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධීක්ෂණ අඩුපාඩු | ජාතික අධ්‍යාපන ආයතනය අප වෙත දන්වා ඇත්තේ ඔවුන් මෙම රු.මිලියන **10**, විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය සඳහා උපයෝගී කර ගත් බවය. මෙයට අදාලව මූල්‍ය ප්‍රගතිය සමඟ භෞතික ප්‍රගති වාර්තාවක් ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත. | භාවිතා කළ අරමුදල් පිළිබඳ සාක්ෂි ලබා ගැනීමට කටයුතු කළ යුතු බව |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකස් කර නොතිබුණි. එබැවින් වසර අවසානයේ ප්‍රගති වාර්තාවට සාපේක්ෂව භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඇගයීමට ලක් කිරීමට නොහැකි විය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (2020) අනුව ක්‍රියාත්මක කරන ලද සියලුම ක්‍රියාකාරකම් අදාළ වර්ෂයේ කාර්ය සාධන (ප්‍රගති) වාර්තාවට ඇතුළත් කර ඇති බව දක්නට ලැබේ. | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව ක්‍රියාකාරී සැලැස්මට අනුව සකස් කළ යුතු බව |

**3.3** මතභේදාත්මක ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ජාතික අධ්‍යාපන ආයතනය යටතේ විෂයමාලා සංවර්ධනය, වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම සහ පර්යේෂණවල නිරත වීම සඳහා රුපියල් මිලියන 120 ක් වෙන් කර තිබුණි. නමුත් එම ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 95ක් ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම් සඳහා වියදම් කර තිබුණි. | COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන්, පාසල් වසා දැමූ කාල සීමාව තුළ සිසුන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා අධ්‍යාපන වැඩසටහන් විකාශනය කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත. මෙම සන්දර්භය තුළ, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ අනෙකුත් අදාළ නිලධාරීන් එක්ව ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන වැඩසටහන් සකස් කිරීම, ඔවුන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සහ ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා මසකට පැය 300 ක අතිකාල දීමනා ගෙවීම සිදු කිරීම. ගුරු ගෙදර අධ්‍යාපන රූපවාහිනී වැඩසටහන්වලට අදාළව ඉහත කටයුතු සඳහා ගෙවා ඇති මුදල රු. මිලියන 220.15 කි. | ලබා දෙන ලද ප්‍රතිපාදන ව්‍යාපෘතියේ අරමුණු සඳහා යෙදවිය යුතු බව |

**3.4** ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කතන්දර පොතක්, සිංහල මාධ්‍ය පිටපත් 155,475 ක් සහ දෙමළ මාධ්‍ය පිටපත් 73,475 ක් මුද්‍රණය කර සැපයීම සඳහා රුපියල් මිලියන 5.76 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, 2021 පෙබරවාරි 24 වන දින වන විටත් රුපියල් මිලියන 2.3 ක් වටිනා පොත් 94,000 ක් බෙදා හැරීමකින් තොරව ගබඩාවේ ඉතිරි වී තිබුණි. | "යාළු යාළු යාලුවෝ" ළමා කතා පොතේ සිංහල පිටපත් 155,475 ක් සහ දෙමළ පිටපත් 73,475 ක් මුද්‍රණය කර බෙදා හැරීම 2020 ජනවාරි මාසයේ සිට ආරම්භ කරන ලදී. කෙසේ වෙතත්, COVID-19 වසංගත තත්වයේ ප්‍රතිඵලයක් ලෙස පාසල් වසා දැමීම හේතුවෙන් මෙම පොත නිසි ලෙස බෙදා හැරීමට නොහැකි විය. | ඉතිරි තොග ප්‍රමාදයකින් තොරව බෙදා හැරීමට කටයුතු කළ යුතු බව |